සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: 111 | පැය / மணித்தியாலம் / Hours: 02 |

**සැලකිය යුතුයි.**

උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

**1,2,3,4** ප්‍රශ්නවලටත් **5,6,7** ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නිශ්චිත ලකුණු ගණන **80**කි.

---

01) (i) සිට (x) තෙක් ඇති **සියලු ම** ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) " මිනිස්සු හිර ගෙදර උන්න හිටියෙ හැටියෙ මුල්ලකට ගිහින් වැටෙනවා.මැරෙනවා"

(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටා ගත් මුල් කෘතිය ලියූ ලේඛකයාගේ නම ලියන්න.

(ii) "අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද"?

(අ) මෙහි "ඌ" යනුවෙන් කියවෙන අයගේ නම ලියන්න.

(ආ) මෙසේ කීමට හේතුව කුමක් ද?

(iii) (අ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද නවකතාවක් නම් කරන්න.

(ආ) ඔහු වඩාත් ගුරුකොට ගන්නේ කුමන නාට්‍ය සම්ප්‍රදායක් ද?

(iv) " රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට "

(අ) මෙම පද්‍ය පාදය අයත් පද්‍ය පන්තියෙහි කතුවරයා සඳහන් කරන්න.

(ආ) ඔහු, "සිංහල ෂෙලී " යන පට බැඳි නාමයෙන් හැඳින්වූයේ ඇයි?

(v) "බැලුව මැනව දේවයන් වහන්ස, මෙබඳු ඇඹුල මලක් හා මේ සා දිග ඇඹුල දණ්ඩක් දුටු විරු දැ නැතැ"යි කී ය.

(අ) " දේවයන් වහන්ස "යනුවෙන් ආමන්ත්‍රණය කෙරුණු අයගේ නම සඳහන් කරන්න.

(ආ) මෙසේ ප්‍රකාශ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(vi) (අ) ගුත්තිල කාව්‍යය ලියැවුණු යුගය නම් කරන්න.

(ආ) මෙම කෘතිය රචනා කිරීමට ආරාධනා කළ අයගේ නම ලියන්න.

(vii) " වහන්සේ මට දැහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති "

(අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කිනම් ස්ථානයක දී ද?

(viii) (අ) " මුනි සිරිපා සිඹිමින්නේ " යන පද්‍ය පන්තිය උපුටා ගත් ග්‍රන්ථය සඳහන් කරන්න.

(ආ) මෙහි කතුවරයා විසින් රචනා කරන ලද ළමා නිර්මාණයක් නම් කරන්න.

(ix) (අ) ලංකාවේ බිහි වූ ජනකවි කිනම් යුගයක සිට ආරම්භ වී ඇතැයි සැලකේ ද?

(ආ) හානා හීය පානා අඬහැරෙන් දැනේ " යන පැදි පෙළෙහි අරමුණ කුමක් ද?

(x) (අ) "ධම්මපදට්ඨකථාව "ඇසුරෙන් ලියවුණු කෘතියෙහි නම ලියන්න.

(ආ) "අමා වතුර " කතුවරයා ලියූ වෙනත් කෘතියක් නම් කරන්න.

(ලකුණු 02 x 10= 20 )

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ඈ කෝරලේ මහත්තයාගෙන් තාවකාලික ව ඉල්ලා ගත් කරත්තයක තමා සතු බඩු මුට්ටු ටිකත් පටවා ගෙන ළමා ළපටිනුත් කැටුව කොටගොඩ බලා පිටත් වූවා ය.

(අ) මෙම වාක්‍යය රසවත් කිරීමට යොදා ගත් භාෂා උපක්‍රමය කුමක් ද?

(ආ) මෙහි සඳහන් තැනැත්තිය මෙසේ ගම අතහැර යාමට බල පෑ හේතු දෙකක් දක්වන්න.

(ii) පහත කවියෙහි ඉතිරි කවි පාද දෙක සම්පූර්ණ කරන්න.

පන්සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වේණු නදයෙන් තොස්වූ
(අ)
(ආ)

(iii) තව ද උගනිතත් නිරවද්‍ය ශිල්පයක් මුත් සාවද්‍ය ශිල්පයෙන් ***ඓහලෞකික*** ප්‍රයෝජනයක් මුත් ***පාරලෞකික*** ප්‍රයෝජන නැති නියාව හඟවන්නට උග්ගසේන නම් සිටු පුත්හුගේ වත කියමු.

(අ) අංකිත පදවල අදහස ලියන්න

(ආ) මෙම පාඨයෙන් ලබා දෙන උපදේශය කුමක් ද?

(iv) රජ එකල්හි " කිමෙක් වෙ ? "යි **පුළුවුත්තෙන් "**සොරෙක් වේ"යි කී යැ. "එක සොරෙක් වෙයි හො? බොහෝ සොරුන් ගෙනැ රට **පහරනට** නිසි සොරෙක් වෙයි හො? "යි කී යැ.

(අ) මෙම සංවාදය ඇති වූයේ කවුරුන් අතර ද?

(ආ) අංකිත පදවල තේරුම් ලියන්න.

(v) තුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තිදසින් දා
කුරිරු ගිජින් දා
කුඹුතල සින් දා
ලමි සේ කෙසරින් දා
මා පිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ

(අ) මෙම ගීත ඛණ්ඩයෙන් මතුවන සිංහබාහුගේ චරිත ලක්ෂණය කුමක් ද?
(ආ) මෙහි දැක්වෙන උපමා දෙක උපුටා ලියන්න.

(ලකුණු 04 x 05 = 20)

(03) අංගුලිමාල දමනය රසවත් කිරීමෙහි ලා
(i ) කෙටි වැකි උපයුක්ත කොට ගැනීමත්
(ii) සජීවි සංවාද භාවිත කිරීමත්
යන භාෂා ප්‍රයෝග කෙතෙක් දුරට ගැළපේ දැ'යි එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන විමසීමක් කරන්න.

(ලකුණු 15)

නැතහොත්

ගුත්තිල කාව්‍යයෙහි එන ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනයේ දී

(i) දෙව්ලියන්ගේ රංගන විලාසයත්
(ii) මිනිසුන්ගේ වෙනස් වූ චර්යා රටාවත්

ප්‍රබල අවස්ථා නිරූපණයකට දායක වී ඇති අයුරු එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

04) උග්ගසේන වස්තුවෙහි එන
(i) උග්ගසේන සිටු පුත්‍රයාත්
(ii) විද්දත් දියණියත්

ඔවුන්ගේ ම ක්‍රියා කලාප හේතු කොට ගෙන අම්හිරි යුග දිවියකට මඟ පාදා ගත්හ. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 15)

නැතහොත්

යටත් විජිත යුගයක දී ලාංකිකයන්ගේ

(i) දේශාභිමානය වඩවාලීමත්
(ii) චරිත සංවර්ධනය ඇති කරලීමත්
"මුනි සිරිපා සිඹිමින්නේ " යන පද්‍ය පන්තියෙන් නිරූපණය කෙරෙන අයුරු එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන විමසන්න.

(ලකුණු 15)

05) ‘‘නිදහස් අදහස් දරන තරුණයකුගේ ස්වභාවය සිංහබාහු චරිතයෙන් විද්‍යාමාන වෙයි.’’
‘‘ලෙන අතහැර යාම’’ පාඩමෙන් උදාහරණ **තුනක්** ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 10)

06) විවිධ කාව්‍යෝපක්‍රම භාවිත කරමින් පාඨක මනස රසවත් හැඟුමින් පුරවාලීමට ‘‘ගංගාවේ සංගීතය’’ පද්‍ය පන්තියෙහි රචකයා සමත් වූ ආකාරය උදාහරණ **තුනක්** මඟින් විස්තර කරන්න.

(ලකුණු 10)

07) බැද්දේගම රසවත් නිර්මාණයක් වීමට එහි යොදා ගත් භාව පූර්ණ ගැමි ජනවහර හේතු වූ ආකාරය උදාහරණ **තුනක්** මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)